මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 වන දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 වන දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජුලි 18 වන දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

2015 වර්ෂයට අයත් වියදම් දෙකකට අදාළ එකතුව වූ රු.19,320 ක් ප්‍රවර්ථන වර්ෂයේ වියදමක් ලෙස පෙන්වීමෙන් වියදම ඉක්මවූ ආදායම රු.19,320 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

-------------------

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනට රු.10,816,113 ක් පියවිය යුතු මුදල නියමිත පරිදි නොපියවීමෙන් 2017 ජුනි 10 දිනට රු.4,789,293 ක මුදලක් තවදුරටත් පියවීමට ඉතිරිව තිබුණි.

1.3.3 නිති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ සඳහා අනුකූල නොවීම පහත පරිදි විගණනයේදී නිරීක්‍ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | |
| | i. රීති අංක 59 | සෑම වර්ෂයක් ආරම්භයේදී ආදායම් පරීක්‍ෂක හෝ ආදායම් පරිපාලක හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් සභා බල ප්‍රදේශය තුළ පිහිටි කර්මාන්ත පිළිබඳ වාර්තාවක් සකස් කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 150(1) රීතිය ප්‍රකාරව වෙළඳ බද්දක් අය කළ යුතු වුවත්, එසේ අය කිරීමට කටයුතු සිදු කර නොතිබුණි. |
| | ii. රීති අංක 178(3) | අනුමත ආයතන හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලේඛනයක් සභාව විසින් පිළියෙල කර නොතිබුණි. |
| | iii. රීති අංක 218 | සෑම වර්ෂයකට එක් වරක් හෝ ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ පරීක්‍ෂාවක් සිදු කර වර්තාවක් සැකසීම සභාවේ ලේකම්වරයා විසින් සිදුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | i. මුදල් රෙගුලාසි 104 | අඩම්පන් ක්‍රීඩාගාරයේ ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් 2015 වසරේදී නිකුත් කළ විගණන විමසුම මඟින් රු.160,700 ක අධි ගෙවීමක් සිදුව ඇති බවට දක්වා ඇති නමුත් මෙම අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට සභාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |
| | ii. මුදල් රෙගුලාසි 371(2)(ආ) සහ 5 වන උප වගන්ති | එක් එක් අවස්ථාව වෙනුවෙන් රු.20,000 ක උපරිමයකට යටත්ව අතුරු අග්‍රීමය නිකුත් කළ යුතු අතර අදාළ කාර්යය නිම වූ වහාම එය පියවීමට කටයුතු කළ යුතු වේ. එසේවුවද, අවස්ථා 16 කදී එලෙස කටයුතු කර නොතිබුණි. |
| | iii. මුදල් රෙගුලාසි 571 | කල් ඉකුත් වූ රු.3,878,757 ක් වටිනා තැන්පතු නියාදනය කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.2,063,607 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.3,225,215 ක් විය.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

-------------------------------

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද අයවැයගත ආදායම හා තත්‍ය ආදායම පිළිබඳ සැලකිය යුතු වෙනස්කම් පහත පරිදි නිරීක්ෂණය විය.

| ආදායම් විස්තරය | අයවැයගත ආදායම | තත්‍ය ආදායම | හිඟ ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| බදු කුලි | 7,022,000 | 8,921,915 | 1,899,915 | 27 |
| බලපත්‍ර ගාස්තු | 503,500 | 1,874,720 | 1,371,220 | 272 |
| සේවා ගාස්තු | 3,105,850 | 6,277,565 | 3,171,715 | 102 |
| වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 3,645,000 | 7,414,672 | 3,769,672 | 103 |
| අනෙකුත් ආදායම් | 4,428,999 | 1,959,631 | (2,469,368) | (56) |
| රජය ප්‍රදාන | 28,660,556 | 22,970,711 | (5,689,845) | (20) |

#### 2.2.2 කඩ කුලි

----------

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මාන්තෛයි බටහිර ප්‍රාදේශීය සභාවේ වෙළඳ කඩවලින් හා මස් වෙළඳපළ වෙතින් ලැබිය යුතු ආදායම් ලෙස රු.13,131,313 ක් පෙන්නුම් කළ අතර 2017 ජුනි 10 දින වන විට එය රු.2,289,137 ක් වූ අතර මෙම හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 අනෙකුත් ආදායම්

-----------------------

මාන්තෛයි බටහිර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඉදිකරන ලද නිවාස 411 ක් වෙනුවෙන් නිවාස ඉදිකිරීමේ අනුමැතිය ලබාදීමේ අයදුම්පත්‍ර සභාව විසින් නිකුත් කර තිබුණද, ඊට අදාළ අයවිය යුතු රු.863,100 ක්වූ අයදුම්පත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

3.1 මෙහෙයුම් ආකාර්යක්‍ෂමතා

-----------------------------------

(අ) ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු. 10,725,000 ක් වටිනා කොන්ත්‍රාත් වැඩකටයුතු 19 ක් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ඉන් රු.9,425,000 ක් වටිනා කොන්ත්‍රාත් 15 ක වැඩ කටයුතු 2017 ජුනි 10 දින දක්වා ඉටුකර නොතිබුණි.

(ආ) මාන්තෛයි බටහිර ප්‍රාදේශීය සභාවෙහි වැඩකටයුතු සම්බන්ධයෙන් ලේකම්වරයෙකු, අභ්‍යන්තර විගණකවරයකු, විෂය නිලධාරීන් හා ආදායම් පරීක්ෂකයින් සේවය කළද පහත දැක්වෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීමෙන් ඔවුන්ගේ මෙහෙයුම් අකාර්යක්‍ෂමතාවය පෙන්වයි. (විස්තර පහත දැක්වේ)

| අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|
| --------- | ----------- | --------------- |
| | | රු. |
| 01 | වෙළඳ කඩ හා මස් කඩවලින් ලැබිය යුතු ආදායම් | 1,515,201 |
| 02 | නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලැබීය යුතු අයදුම්පත්‍ර ගාස්තු | 863,100 |
| 03 | දුරකථන සම්ප්‍රේෂණ කළුණුවලින් ලැබිය යුතු ආදායම | 400,000 |
| 04 | බයිසිකල් බලපත්‍ර ගාස්තු | 6,400 |
| | එකතුව | ---------- |
| | | 2,784,701 |
| | | ======== |

3.2 වත්කම් කළමනාකරණය

-----------------------------

(අ) ප්‍රවර්ථන වර්ෂයේදී සභාව විසින් භාවිතා කරන ලද KX -4729 දරන වාහනය 2015 අප්‍රේල් 08 දින මන්නාරම නගර සභාවේ කටයුතු සඳහා භාවිතා කර ඇති අතර එහිදි ඩීසල් ලීටර් 40 ක් යෙදන ලද අතර එය වාහන ධාවන සටහනක ගෙන තිබුණි. එසේ වුවද, සභාවේ ඉන්ධන ගිණුමෙහි එය සටහන් නොකිරීමෙන් රු.4,680 ක අලාභයක් සිදුව තිබුණි.

(ආ) ප්‍රවර්ථන වර්ෂයේදී ZA-4595 දරන බැංකෝ ලෝඩරය සඳහා සපයන ලද ඩීසල් ලීටර් 591 කට අදාළ රු.56,212 ක මුදලක් අඩුවෙන් ධාවන සටහන්වල ගෙන තිබුණි.

3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

සභා බල ප්‍රදේශය තුළ එකතු වන කුණු කසළ ගිනි තබා විනාශ කිරීම හා පස් දමා වසා දැමීම ආදී කටයුතු පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් පොහොර සෑදීම හා නැවත භාවිතයට ගැනීම් යනාදී ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය වගකිව යුතු පියවරයන් සභාව විසින් ගෙන නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

----------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

------------------------------------

ශේෂ පිරික්සුමේ හා ආදායම් වියදම් ගිණුමෙහි “රුපියල්” ලෙස සඳහන් කර නොතිබුණි.

4.2 අයවැය පාලනය

--------------------

ප්‍රවර්ථන වර්ෂයේදී අයවැය ඇස්තමේන්තුව මඟින් වෙන්කරන ලද වැය විෂයයන් 26 කට අදාළව එකතුව රු.7,254,350 ක ප්‍රතිපාදනයන් සියයට 40 සිට සියයට 100 දක්වා භාවිතා කර නොතිබුණි.

4.3 පිළිතුරු නොලත් විගණන විමසුම්

---------------------------------------

ප්‍රවර්ථන වර්ෂයේදී අංක NNP/MA/A/PS/MW/FA/2015/AQ21 දරන විගණන විමසුම මා විසින් නිකුත් කළ අතර ඒ සඳහා ලබාදුන් කරුණු දැක්වීම් සම්බන්ධයෙන් එකඟ නොවුණි. මේ හේතුවෙන් එම විගණන විමසුමෙහි කරුණු සම්බන්ධයෙන් සහකාර පළාත් කොමසාරිස්වරයා සමඟ සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යලයෙහි සිදු කළ සාකච්ඡාවේදී තීරණය වූයේ සභාව මඟින් කමිටුවක් පත්කර ඒ සඳහා පිළිතුරු සැපයිය යුතු බවයි. එසේවුවද, 2017 ජුනි 10 දින දක්වා කිසිදු පිළිතුරක් ලබාදී නොතිබුණි.

5. පද්ධති හා පාලන

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම්

(ආ) අයවැය පාලනය

(ඇ) ලැබිය යුතු ගිණුම්

(ඈ) තොග පාලනය

(ඉ) ගිණුම්කරණය